www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# දේශගුනික විපර්යාස පිලිබඳ ක්‍රියාමාර්ගයක් නොමැතිකම මෙතෙක් වාර්තා වූ උනුසුම්ම දශකයට මග පාදයි

Lack of action on climate change leads to warmest decade ever recorded

**2020 ජනවාරි 20**

ලෝක කාලගුන විද්‍යා සංවිධානය (ලෝකාස), එක්සත් ජනපද අභ්‍යවකාශ ඒජන්සිය වන නාසා හා ජාතික සාගර හා වායුගෝලීය පරිපාලනය (ජාසාවාප) යන සියලු සංවිධාන ස්වාධීනව නිගමනය කර ඇත්තේ 2010 සිට 2019 දක්වා වූ පසුගිය දශකය මෙතෙක් වාර්තා වූ උනුසුම්ම ගෝලීය මතුපිට උෂ්නත්වය අත්විඳ ඇති බව යි. 1960 ගනන්වලින් පසු සෑම දශකයක් ම තිබී ඇත්තේ ඊට පෙර පැවති දශකයට වඩා උනුසුම්ව යි.

2015-2019 දක්වා වසර පහ වඩාත් ම උනුසුම් කාලය විය. 2019 දෙවන වඩාත් උනුසුම් වසර වූ අතර, එය 2016 දී පමනක් ඉක්මවා ගියේ, එල් නිනෝ කාලගුනික රටාව මගින් උෂ්නත්වය මෙතෙක් ලියාපදිංචි වී ඇති ඉහලම මට්ටමට තල්ලු කල අවස්ථාවේ දී ය. පූර්ව කාර්මික යුගයේ සිට සාමාන්‍ය මතුපිට උෂ්නත්වය සෙල්සියස් අංශක 1.1 කින් ඉහල ගොස් ඇති අතර බොහෝ තාපය උරා ගන්නා සාගර ඊටත් වඩා වේගයෙන් උනුසුම් වෙමින් තිබේ. විශ්වාසනීය විද්‍යාඥයින් අතර, මිනිසා විසින් කාබන් ඩයොක්සයිඩ් සහ අනෙකුත් හරිතාගාර වායුව වායුගෝලයට විමෝචනය කිරීමේ දිගුකාලීන බලපෑම මෙයට හේතුවන බවට කිසිදු විවාදයක් නොමැත.

ලෝකාස මහලේකම් පෙටෙරි ටාලස් මෙසේ අදහස් දැක්වී ය. "2019 වසර ශේෂ වූ තැනින් 2020 වර්ෂය ආරම්භ වී ඇත්තේ, ඉහල බලපෑම් සහිත කාලගුනය හා දේශගුනය සම්බන්ධ සිදුවීම්වලිනි. 2019 දී ඔස්ට්‍රේලියාවට තම වාර්තාගත උනුසුම් මෙන් ම වියලිම වසර ගෙවුනේ, දැවැන්ත ලැව්ගිනිවලට වාතාවරනය සකස් කරමිනි, මෙය මිනිසුන් මෙන් ම දේපල, වන ජීවීන්, පරිසර පද්ධති සහ පරිසරයට අතිමහත් ලෙස විනාශකාරී විය. අවාසනාවන්ත ලෙස, 2020 සහ ඉදිරි දශක කිහිපය තුල වඩාත් ආන්තික කාලගුනයක් දැකීමට අපි අපේක්ෂා කරමු. වායුගෝලයේ උනුසුම සිර කර තබා ගන්නා හරිතාගාර වායුවල වාර්තාගත මට්ටම්වලින් ඉන්ධන සපයන වඩාත් ආන්තික දේශගුනයක් දැකීමට අපි අපේක්ෂා කරමු."

ලොව පුරා මිලියන සිය ගනනක් ජනයා දේශගුනික විපර්යාසයන්ගේ බලපෑමෙන් පීඩා විඳිති. විද්‍යාඥයින් විශ්වාස කරන්නේ, 2019 දී පමනක් වඩාත් දැඩි තාප තරංග, නියඟ සහ ගින්න, වඩාත් නිත්‍ය හා දැඩි නිවර්තන කුනාටු සහ ගංවතුර, සාගරවල ආම්ලිකතාව වැඩි වීම, වේගවත් නිත්‍ය තුහීන දියවීම, ආක්ටික් හා ඇන්ටාටික් ප්‍රදේශවල අයිස් තට්ටු තුනී වීම හා මුහුදු මට්ටමේ අඛන්ඩව ඉහල යාම සඳහා ප්‍රධානතම සාධකය වූයේ ගෝලීය උනුසුම බව යි.

ගෝලීය උෂ්නත්වය ඉහල යාම වැලැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ගය කවුරුත් දන්නා කරුනකි. වායුගෝලයේ පවතින කාබන් ග්‍රහනය කර ගැනීම සඳහා සත්‍යාපිත මාධ්‍යයන් යෙදවීමත් සමග පොසිල ඉන්ධනවල කාබන් නොවන විකල්ප තොග වශයෙන් යෙදවීමෙන් විමෝචනය විශාල ලෙස අඩු කල යුතු ය. ඒවා නැත්නම්, "වත්මන් මාවතේ... අප ගමන් කරමින් සිටින්නේ සියවස අවසන් වන විට සෙල්සියස් අංශක 3 සිට 5 දක්වා උෂ්නත්වය ඉහල යාමක් කරා" යැයි ලෝකාසහි ටලාස් අදහස් දැක්වී ය.

එහෙත්, ගෝලීය කාබන් ව්‍යාපෘතියේ ඇස්තමේන්තු වලට අනුව, ප්‍රසිද්ධ අන්තරායන් සහ පොසිල ඉන්ධන භාවිතය අඩු කිරීමේ අවශ්‍යතාව පිලිගන්නා බව සංගත සහ ආන්ඩු විසින් කරන ලද සියලුම ප්‍රකාශයන් තිබිය දී, 2019 දී කාබන් විමෝචනය මෙතෙක් පැවති ඉහලම මට්ටමට නැග තිබේ. තවමත් ගෝලීය සමස්තයෙන් සියයට 40ට වග කියන, ගල් අඟුරු වලින් එන විමෝචනය අඩුවුව ද, ඒවා වැඩි වූයේ තෙල් හා ස්වාභාවික ගෑස් භාවිතයෙනි.

විනාශකාරී ගෝලීය උෂ්නත්වය ඉහල යාම වැලැක්වීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කර ඇති, බලයේ සිටින අයගේ නොසැලකිලිමත්කම සහ සාපරාධීත්වය පිලිබඳව ජාත්‍යන්තර ව, විශේෂයෙන් කම්කරු පන්තිය තුල හා ලෝකයේ තරුන තරුනියන් අතර ඉමහත් කෝපය වර්ධනය වෙමින් පවතී.

කෙසේ වෙතත්, ඉදිරි මාස හා අවුරුදුවල දේශපාලන අරගලවලට ලබා දිය යුතු අවබෝධය වන්නේ, මෙම සංගත හා ආන්ඩුවල අකාර්යක්ෂමතාව මෙන් ම උදාසීනත්වය කෙලින්ම පැන නගින්නේ ධනේශ්වර පද්ධතියේ අතාර්කිකත්වයෙන් බව යි. දේපලවල පෞද්ගලික අයිතිය, ලාභ සමුච්චනය සඳහා නිෂ්පාදනය යටත් කිරීම හා ලෝකය ප්‍රතිවාදී ජාතික රාජ්‍යයන් ලෙස බෙදීම මත පදනම් වූ සමාජ පද්ධතියක්,

එනම් ධනේශ්වර පද්ධතිය දේශගුනික අර්බුදය විසඳීමට අවශ්‍ය සමායෝජිත ජාත්‍යන්ර සැලසුම්කරනයට හා අවශ්‍ය සම්පත් වෙන් කිරීමට අසමත් ය.

නව යොවුන් වියේ දේශගුනික විපර්යාස ක්‍රියාකාරිනියක වන ග්‍රේටා තුන්බර්ග්ගේ ඍජු තක්සේරුව අනුව, දේශපාලන හා සංගත නායකයින්ගේ සදාචාරාත්මක හෘදය සාක්ෂියට කෙරෙන විරෝධය දැක්වීම, "කිසිවක් අත් කර ගෙන නැත."

ඒ වෙනුවට, එක්සත් ජනපදයේ ට්‍රම්ප් පාලනාධිකාරිය විසින් මෙහෙයවනු ලබන ජාත්‍යන්තර ආන්ඩු අවධාරනය කරන්නේ, "තම" කර්මාන්තවල තරඟකාරිත්වය හා තමන්ගේ "ජාතික අවශ්‍යතා" සඳහා අඛන්ඩ පමනක් නො ව විහිදුනු පොසිල ඉන්ධන භාවිතය අත්‍යවශ්‍ය බව යි.

ධනවත් ප්‍රභූ පැලැන්තියට විශාල ප්‍රතිලාභ ලබා දෙන, අන්තර්ජාතික පෞද්ගලික හෝ රජය සතු බලශක්ති සංස්ථා 100 ක් පමනක් සියලුම විමෝචනයන්ගෙන් සියයට 71 කට වගකිව යුතු ය. සමස්තයක් වශයෙන් මානව වර්ගයාගේ දිගුකාලීන අවශ්‍යතාවන්ට වඩා කොටස් හිමියන්ගේ ප්‍රතිලාභ හෝ කර්මාන්ත සඳහා ලාභ බලශක්තිය පිලිබඳ පටු, කෙටිකාලීන වුවමනාවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

ගින්න මහාද්වීපයේ විශාල ප්‍රදේශවල පැතිරෙන ඕස්ට්‍රේලියාවේ, දේශගුනික විපර්යාසයන්ගේ යථාර්ථයන් මුලුමනින් ම එරටට ගෙන එනු ලැබූ අතර, රටේ අගමැති ස්කොට් මොරිසන් සති අන්තයේ තරයේ මෙසේ කියා සිටියේ යඃ "මම කාබන් බද්දක් පනවන්නේ නැහැ. මම මිනිසුන්ගේ විදුලි මිල ගනන් ඉහල දාන්නේ නෑ වගේ ම මම මිලියන ගනනක් ඕස්ට්‍රේලියානුවන්, විශේෂයෙන් කලාපීය ඕස්ට්‍රේලියානුවන් යැපෙන සම්පත් අංශයක් අතුගා දමන්නේ නෑ."

පොසිල ඉන්ධන කර්මාන්තයේ විශේෂයෙන් ගොරහැඩි ආරක්ෂකයෙකු වන මොරිසන්ට "මිලියන සංඛ්‍යාත ඕස්ට්‍රේලියානුවන්" ගැන කිසිදු තැකීමක් නැති නමුත් විශාලතම ගල් අඟුරු අපනයනකරුවා මෙන් ම විශාලතම ස්වාභාවික වායු නිෂ්පාදකයින්ගෙන් එකක් ලෙස, ඕස්ට්‍රේලියාවේ තත්වයෙන් ඩොලර් බිලියන ගනනක් ලාභ උපයන බලශක්ති සමාගම් ගැන උත්සුක ය. බදුකරනය සම්බන්ධයෙන් ගත් කල, ගෝලීය ක්‍රියාදාමයන්ට සමාන්තර වෙමින් ඕස්ට්‍රේලියාවේ අනුප්‍රාප්තික ආන්ඩු, සංගත සහ පුද්ගලික ආදායම යන දෙකට ම බදු අනුපාතය අඩු කර ඇත. අඩු වියදම් පුනර්ජනනීය විදුලි උත්පාදනය ඇතුලුව සමාජමය වශයෙන් ප්‍රයෝජනවත් අරමුනු සඳහා භාවිතා කල හැකි අති විශාල ධනය ඉහලම සියයට 10, විශේෂයෙන් ම ඉහල සියයට 1 වෙත හරවා යවා ඇත.

මෑත සතිවල ඕස්ට්‍රේලියාව තුල පෙන්නුම් කර ඇති පරිදි, වඩ වඩාත් දරුනු ව්‍යසනයන් සඳහා සූදානම් වීමට හා ඒවාට ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය හදිසි හා සෞඛ්‍ය සේවාවන් සම්පත් අඩු සහ කාර්ය මන්ඩල අඩු ඒවා වන අතර ජනගහනයෙන් ඉතා සුලු සංඛ්‍යාවක් පුද්ගලික ධනයෙන් අශිෂ්ට ප්‍රමානයක් උපයාගෙන ඇත.

එපමනක් නොව, වෙලඳපල සහ ලාභ පංගුව සඳහා වන සංගත අරගල මධ්‍යයේ, ජාතික රාජ්‍යයන් වෙන කවරදාටත් වඩා විශාල සම්පත් හරවා යවමින් සිටින්නේ යුද සූදානමට මිස වායු විමෝචන අඩු කිරීමට නො වේ. 2018 දී මිලිටරි වියදම් තවත් සියයට 2.7 කින් වැඩි වී අවම වශයෙන් ඩොලර් ට්‍රිලියන 1.8 ක් දක්වා ඉහල ගොස් ඇති අතර ඉන් වැඩි ප්‍රමානයක් එක්සත් ජනපදය විසින් දරන අතර චීනය, යුරෝපීය බලවතුන්, සවුදි අරාබිය සහ ඉන්දියාව ඊට පසු පස සිටී. මෙම රටවල් ද වැඩිම කාබන් විමෝචනයට වගකිව යුතු රටවල් වේ.

මිලිටරි උපකරන ම ද වායු විමෝචනයේ කැපී පෙනෙන සාධකයකි. එය වෙනම ජාතියක් ලෙස ගනන් ගනු ලැබුවහොත්, කොල්ලකාරී යුද්ධ හා බිය ගැන්වීමේ තම දැවැන්ත ගෝලීය මෙහෙයුම් පවත්වා ගැනීම සඳහා, එක්සත් ජනපද මිලිටරිය විසින් කෙරෙන ඉන්ධන භාවිතය පමනක්, එය 2017 දී ලෝකයේ 47 වන විශාලතම විමෝචකයා ලෙස ශ්‍රේනිගත කිරීමට ඉඩ තිබුනි.

ජනවාරි 3වැනිදා, "සමාජවාදී විප්ලවයේ දශකය ආරම්භ වේ" නම් ලෝක සමාජවාදී වෙබ් අඩවි *ඉදිරිදර්ශන* ලිපිය එලඹෙන කාල පරිච්ඡේදයේ දේශපාලන අභියෝග පිලිබඳ සංක්ෂිප්ත හා වෛෂයික සාරාංශයක් ඉදිරිපත් කලේ ය. ඓතිහාසිකව යල්පැන ගිය ධනවාදී පර්යාය ආරක්ෂා කරන අය, විනාශකාරී මහා බලවතුන්ගේ යුද්ධ, අමාරුවෙන් දිනාගත් ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් විනාශ කිරීම, පරිසරය පිරිහීම, පෙර නොවූ විරූ ආකාරයේ සමාජ අසමානතාවයන් සහ අනවශ්‍ය වියෝගය හා දුක් වේදනා කරා යන අවගමනේ ප්‍රධානත්වය ගනිමින් සිටිති.

ධනවාදයට අවසානයක් ගෙන ඒමට සහ පුද්ගලික ලාභයට නොව මානව අවශ්‍යතාවයට ප්‍රමුඛතාවය දෙන සමාජවාදී සමාජයක් බිහි කල හැකි එකම සමාජ බලවේගය වන්නේ ජාත්‍යන්තර කම්කරු පන්තිය යි. කෙසේවෙතත්, සෑම දෙයක්ම රඳා පවතින්නේ, සමාජවාදී විඥානයෙන් යුක්ත වෙමින් හා විප්ලවීය වෙනසක් සඳහා ලෝක ව්‍යාප්ත ව්‍යාපාරයක් බවට ඒකාබද්ධ වෙමින්, මේ වන විටත් රටකින් රටකට දිග හැරෙමින් පවතින, කම්කරුවන්ගේ මහජන අරගල මත ය. ලෝක තත්වයේ බරපතලකම සහ දේශගුනික විපර්යාස නිසා ඇති වන අර්බුදය හඳුනා ගන්නා සියලුම කම්කරුවන්ගේ හා තරුනයින්ගේ උත්සාහය මෙම කාර්යය සඳහා කැප කල යුතු ය.

**ජේම්ස් කොගන්**

© www.wsws.org